# පරාරෝපණයෙන් මිදීමේ සාංදෘෂ්ටිකවාදී විධික්‍රමය

ආචාර්ය යාපාරත්න වීරසේකර[1]

ඉංග්‍රීසි Alienation යන පදයට සිංහල පරාරෝපණය යන්න යෙදේ. එයින් අන්සතුවීම, ඈත්වීම, හැකියාව නැතිව යාම, නිර්මාණයට වහල් වීම අදහස් කෙරේ. ඒකලනය, විගලීකභාවය වැනි සිංහල පද ද මේ සඳහා යෙදේ. මෙහි ප්‍රතිවිරුද්ධ පදය සහභාගීත්වය (Participation) යන්නයි. මුලින් තමා වෙත පැවති දෙය පසුව තමාගෙන් ඈත් වී බාහිර ශක්තියක් බවට පත්වීතමාව පාලනය කිරීම පරාරෝපණය ලෙස හැඳින්විය හැකිය. මේ අනුව රෝපණය යනු තමා ගොඩනගන දෙයයි. එසේ ගොඩනගන දෙය තමාගෙන් ඈත්වීම පරාරෝපණයයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ පරාරෝපණයෙන් මිදීමේ සාංදෘෂ්ටිකවාදීවිධි පිළිබඳ විමර්ශනය කිරීමයි. "මිදීමේ මග" නැමති සාංදෘෂ්ටිකවාදී තේමාව අපට සොයා ගත හැකි වන්නේ සාංදෘෂ්ටිකවාදී පොතපතේ ඉතාමත් වක්‍රව සටහන් කර ඇති සමහර සංකල්පනා විග්‍රහ කර බැලීමෙනි. සාංදෘෂ්ටිකවාදීන්ගේ ප්‍රධාන තේමාව වූයේ ජීවිතයේ ඇති නිස්සාර භාවය තේරුම් කිරීමයි. මිනිසාගේ ආධ්‍යාත්මික ගැටලු විසඳා කිසියම් මිදීමක් පිළිබඳ පැහැදිළි සංකල්පනා ඉදිරිපත් කිරීම ඔවුන්ගේ උත්සාහය නොවීය. සොරේන් කියකිග ාර්ඩ් මිනිස් ජීවිතය සෞන්දර්යාත්මක (Aesthetic stage), ආචාරාත්මක (Ethical stage)" wd.ñl (Religious stage) ලෙස අවධි තුනකට බෙදයි. ඒ ඒ අවධිවල දී පරාරෝපණයෙන් මිදීමේ සුවිශේෂී විධි ඔහු සාකච්ඡා කරයි. නිට්ෂේ නිර්දේශ කරන්නේ උත්තර මිනිසාගේ තත්වයට යාම තුළින් පරාරෝපණයෙන් මිදීමයි. මේ පිළිබඳ සාත්රේ අදහස් ඉදිරිපත් කර ඇත්තේ 'නිදහස' පිළිබඳ සංකල්පය මුල් කොට ගෙනය. කැමූගේ දර්ශනයෙන් ජීවිතය එක්තරා ආකාරයක සටනක් බව කියයි. එහෙත් එය භෞතික සටනක් නොවේ. ඒ සටන වනාහි මිනිසාගේ ආධ්‍යාත්මය විසින් ජීවිතයේ තත්ත්වවලට විරුද්ධව කරනු ලබන සටනකි. මිනිසා මැරෙන තුරු යෙදී සිටින්නේ මේ සටනයෙහිය. කැමූගේ කෘතිවල මිදීමේ ක්‍රම ලෙස සිය දිවි නසා ගැනීම, රසික නිර්මාණ තුළින් තමන්ගේ අභ්‍යන්තර භාවයන් ප්‍රකට කිරීම, කෙසේ හෝ ජීවත් වීම, අවට සමාජය කෙරෙහි මහත් මානව භක්තියකින් යුතුව ජීවත් වීම ආදී විසඳුම් කිහිපයක් ඉදිරිපත් කර තිබේ. ජර්මානු සාංදෘෂ්ටිකවාදී දාර්ශනික හර්මන් හෙස බටහිර දේවවාදී හා අදේවවාදී සම්ප්‍රදායවලින් බෙහෙවින් මෑත්වී පෙරදිග සම්ප්‍රදායේ කේන්ද්‍රීය වශයෙන් ඔප් නැංවෙන ස්ව හික්මීම හා ස්ව අධිෂ්ඨාන යන සංකල්ප තුළින් පරාරෝපණයෙන් මිදීම පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත. හෙසගේ "සිද්ධාර්ථ" නවකථාවෙන් පිළිබිඹු කරන්නේ එයයි.ඒ අනුව පරාරෝපණයෙන් මිදීමේ සාංදෘෂ්ටික විධි පිළිබඳ පුළුල්ව විමර්ශනය කිරීම මෙමගින් සිදුවෙයි.

**ප්‍රමුඛ පද** : පරාරෝපණය, සාංදෘෂ්ටිකවාදය, නිස්සාර භාවය, උත්තර මිනිසා, ස්ව හික්මීම

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
yapaweerasekara@gmail.com